# මැතිවරණ දෙපාර්තමේන්තුව

## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
**பொது அலுவலகம்**

මැතිවරණ කොමසාරිස් - 2868444
**தேர்தல்கள் ஆணையாளர்** ෆැක්ස් **தொலை நகல்** 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
**உதவி ஆணையாளர் (நிருவாகம்)** ෆැක්ස් **(தொலை நகல்)** 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
**தேர்தல்கள் செயலகம்,**
**த. பெ. 2,**
**இராஜகிரிய. 10107**


මගේ අංකය: P.E/24/2010
**எனது இல:**
ඔබේ අංකය :
**உமது இல:**
දිනය : 2010.04.02

<u>TR-02-17</u>

**<u>සියළුම ප්‍රවාහන චක්‍රලේඛයන්හි සාරාංශ ගත</u>**

**<u>ප්‍රධාන චක්‍රලේඛය.</u>**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>ප්‍රවාහන කටයුතු</u>**

ඉහත සඳහන් ඡන්ද විමසීමේ මූලික අවශ්‍යතා සඳහා මෙන්ම ඡන්ද පොළ කාර්ය මණ්ඩලය හා ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහාද වාහන විශාල සංඛ්‍යාවක් ඔබගේ දිස්ත්‍රික්කයට අවශ්‍ය වනු ඇත. මෙසේ යොදා ගනු ලබන වාහනවලට ඉන්ධන සැපයීම සඳහාද එම වාහන වල රියදුරන්ට අතිකාල හා ගමන් වියදම් ගෙවීම සඳහාද, කුලී පදනම මත ලබාගන්නා වාහනවලට කුලී ගෙවීම සඳහාද, අතිවිශාල මුදලක් වැයවේ. එම වියදම් හැකිතාක් දුරට අඩුකර ගැනීම සඳහා පහත දැක්වෙන උපදෙස් අනුගමනය කළ යුතුවේ.

<u>02. රජයේ වාහන භාවිතා කිරීම.</u>

02.01 මෙම ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සිදුකරන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා රජයේ දෙපාර්තමේන්තු වල වාහන පමණක් යොදා ගත යුතුය. එම වාහන වලට අවශ්‍ය ඉන්ධන සඳහා මැතිවරණ වැය ශීර්ෂය යටතේ වියදම් දැරිය හැකි අතර, රියදුරන්ගේ ගමන් වියදම් හා අතිකාල දීමනා මා විසින් අනුමත කරන සීමාවන්ට යටත්ව ඔවුන්ට ගෙවිය හැකිය. **විශාල අළුත්වැඩියාවන් සඳහා වියදම් දැරීමට ඇති වාහන මෙම ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදවා නොගත යුතුය.**

02.02 ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී හෝ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්කර ඇති නිලධාරීන්ට අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී හෝ නියෝජ්‍ය / ජ්‍යෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතියට යටත්ව තම නිල වාහනය හෝ මැතිවරණ රාජකාරී සඳහා තේරීම් භාර නිලධාරීන් වෙත වෙන්කර දී නොමැති තම දෙපාර්තමේන්තුවේ වෙනත් වාහනයක් තිබේ නම් එය හෝ යොදා ගත හැකිය.

**මේ සඳහා තම දෙපාර්තමේන්තුවෙන් අදාල දිස්ත්‍රික්කයට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාගත යුතුය. ඒ සඳහා වැයවූ මුදල දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූරණය කරනු ලැබේ. මේ සඳහා AV-1 හෝ PV-1 යන ආකෘති පත්‍ර යොදා ගත හැකිය. මෙම වාහන වල රියදුරුගේ පැමිණීමේ සහතිකය වශයෙන් CE 51 මුද්‍රිත ආකෘතිය යොදා ගත යුතුය.**

**<u>03. පෞද්ගලික වාහන වලින් ගමන් කිරීම වෙනුවෙන් සැතපුම් ගාස්තු ගෙවීම්.</u>**

03.01 පාර්ලිමේන්තු මැතිවරණයේ **මූලික සංවිධාන කටයුතු හා සම්බන්ධ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික වාහන භාවිතා නොකරන ලෙසට නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.**

03.02 **උපදෙස් පංති වලට සහභාගී වීම සඳහා පෞද්ගලික හෝ නිල වාහන යොදා ගැනීම.**

ආයතන සංග්‍රහය අනුව සැතපුම් කුළී ලබා ගැනීමට හිමිකම් ඇති නිලධාරීන්ට **පහත සඳහන් කාර්යයන් සඳහා පමණක් තම** පෞද්ගලික රථ වලින් / නිල වාහන වලින් (වෙන් කල වාහන) පැමිණීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ සඳහන් සීමාවන්ට යටත්ව සැතපුම් කුළිය ලබා ගැනීමට අවසර දිය හැකිය.

**උපදෙස් පන්ති සඳහා කැඳවුම් ලබන නිලධාරීන් තම පෞද්ගලික මෝටර් රථවලින් පැමිණෙන්නේ නම් තම ස්ථිර සේවා ස්ථානවල සිට උපදෙස් පන්ති පවත් වන ස්ථාන දක්වා සහ ආපසු සිය සේවා ස්ථාන වෙත ගමන් කිරීම සඳහා අනුමැතිය දිය හැකිය. මෙම ගමන් සඳහා සැතපුම් කුලී ගෙවනුයේ කැඳවීම කරනු ලැබූ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී හෝ නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් පමණි. එබැවින් ඒ සඳහා ගෙවීම් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ඔවුන් වෙතය. තම සේවා ස්ථාන මගින් සැතපුම් කුලී ගෙවා එම මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මවෙත කරණ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. <u>නිල වාහන යොදා ගන්නා නිලධාරීන් උපදෙස් පංති වලට සහභාගී වීමට යාම සඳහා තම සේවා ස්ථානයෙන් ඉන්ධන ලබා නොගත යුතුය. එසේ ඉන්ධන ලබා ගැනීමක් කර එම වියදම ප්‍රතිපූරණය කිරීම සඳහා මා වෙත ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ඒවා ප්‍රතික්ෂේප කරන බවද කාරුණිකව දන්වමි</u>**

03.03 **සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ හෝ ඉන් බැහැර දිස්ත්‍රික්කයක මැතිවරණ රාජකාරි සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරීන් එම රාජකාරි සඳහා තම පෞද්ගලික මෝටර් රථ වලින් පැමිණීම සඳහා අදාල තේරීම් භාර නිලධාරීන් ගෙන් හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගෙන් හෝ පෞද්ගලිකවම පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එවැනි අවස්ථාවන්හිදී තම ස්ථිර සේවා ස්ථානය හෝ ආයතන සංග්‍රහයේ සීමාවන්ට යටත්ව නිවසේ සිට හෝ එම තේරීම් භාර නිලධාරී කාර්යාල වෙත එක්වරක් පමණක් පැමිණීමට හා ආපසු යාමට සැතපුම් කුළිය ගෙවිය හැක. තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයෙන් බැහැර දිස්ත්‍රික්කයක මැතිවරණ, රාජකාරි සඳහා කැඳවා ඇති නිලධාරීන්ට එම රාජකාරි සඳහා නිවසේ හෝ කාර්යාලයේ සිට එක් වරකට වැඩියෙන් ගමන් කිරීමට සිදුවන සේ රාජකාරි නොපැවරිය යුතුය.**

03.04 **පොද්ගලික වාහන සඳහා පොද්ගලික රියදුරෙකු යොදවා ගැනීම.**

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් හා ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරීන් තම පොද්ගලික වාහනයට අවශ්‍ය නම් පොද්ගලික රියදුරෙකු යොදවා ගත හැකිය. ඔහුට ගෙවනු ලබන දීමනාව ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතීන් රැගෙන එන වාහනයට යොදා ගන්නා රියදුරුට ගෙවනු ලබන ආකාරයටම වේ. එසේ පැමිණෙන රියදුරු මහතුන් විසින් සහකාර තේරීම්භාර නිලධාරී ප්‍රවාහන භාරයේ ඇති V-1A ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර භාරදිය යුතුය. රාජකාරී අවසානයේදී එම ආකෘතියේ ආ කොටස සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) ලවා සම්පූර්ණ කරවාගෙන ඉන් පිටපතක් ආපසු ලබාගෙන එය තම ගෙවීම් වව්චරයේ පැමිණීමේ සහතිකය වශයෙන් ඇමිණිය යුතුය. මෙම රියදුරන් සඳහා ගෙවීම් කරනුයේ එම රියදුරන්ගේ නමට පමණි.

03.05 වාහන රැගෙන පැමිණෙන නිලධාරීන් විසින් තමන් පැමිණි වහාම තම වාහනයේ ආදායම් බලපත්‍රයේ ජායා පිටපතක්ද V-1 ආකෘතියේ පිටපත් දෙකක්ද සමඟ සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) ට භාරදිය යුතුය. V-1 **ආකෘතියේ ආ කොටස සම්පූර්ණ කරවාගෙන එය තම ගමන් වියදම් වව්චරයට ඇමිණිය යුතුය. එම ආකෘතිය නොමැතිව ගෙවීම් කරනු නොලැබේ.** මේ ආකෘතියට අත්සන් කරන සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) විසින් තම සම්පූර්ණ අත්සන තැබිය යුතු අතර, තම නම හා ස්ථිර පදවි නාමය දක්වන රාජකාරී මුද්‍රාව ද තැබිය යුතුය.

ඉදිරිපත් කරනු ලබන සහතික වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලබන හෙයින් ඒවා අත්සන් කිරීමට බලය පවරනු ලැබූ නිලධාරීන්ගේ නම් ආදර්ශ අත්සන සහිත ලේඛණයක් මා වෙත පසුව ඉදිරිපත් කළ යුතුය.

04. **<u>ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරුන් පොද්ගලික වාහනය ජන්ද විමසීම් රාජකාරී සඳහා යොදා ගැනීම.</u>**

04.01 ජන්ද පොළ රාජකාරී සඳහා පත්කරනු ලබන ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතීන් තම ජන්ද පොළේ ජන්ද පෙට්ටි හා ජන්ද පත්‍රිකා ආදිය රැගෙන යාමට හා ආපසු රැගෙන ඒමට වාහනයක් යොදාගනු ලබන්නේ නම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව එම වාහනය සඳහා කිලෝමීටර් එකකට රු.15 බැගින් ගෙවීම අනුමත කරමි. (සැතපුමක් සඳහා රු.24). **මෙම ගෙවීම් අදාල වනුයේ ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති වරුන් රැගෙන එනු ලබන පොද්ගලික වාහන සඳහා පමණි.**

**<u>කොන්දේසි.</u>**

- එම වාහනය කැරලි කෝලාහල හා මහජන කැළඹීම් ආවරණය සහිත පූර්ණ රක්ෂණය කළ වාහනයක් වීම.
- ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා වාහනය නෙපැදවිය යුතුය. ඒ සඳහා රියැදුරකු යොදාගත යුතුය. රියදුරුට කරනු ලබන ගෙවීම් පිළිබඳව මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛයෙහි සඳහන් කරනු ඇත.
- එම වාහනය ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා, කාර්යාල කාර්ය සහායක, පොලිස් නිළධාරීන් දෙදෙනෙකු හා රියැදුරු ඇතුළු පස් දෙනෙකුට පහසුවෙන් ගමන් කළ හැකි විය යුතු අතර, එම අයගේ ගමන් මලුත්, ජන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ආරක්ෂක ද්‍රව්‍ය රැගෙන යාමට පහසුකම් තිබිය යුතුය.
- මේ සඳහා මරුටි, මාර්ව්, ස්ටාර්ලට් වැනි කුඩා කාර් (**Beetle Car**) භාවිතා නොකළ යුතුය
- වාහනය ඉතා හොඳ ධාවන තත්වයෙන් තිබිය යුතුය

- මෙසේ වාහන රැගෙන එන සෑම ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයකුම රට නියමිත තොරතුරු පත්‍රිකාව පිටපත් දෙකකින් පුරවා සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය.
- ආපසු පැමිණීමේදී ඉහත පිටපත් දෙකින් එකක් සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) ගේ අත්සන ද ලබාගෙන තම ගෙවීම් වව්චරයට ඇමිණිය යුතුය.
- ඉහත පරිදි කිලෝමීටර් ගාස්තු ගෙවිය යුත්තේ අදාළ වාහනය ජන්ද පොළට ජන්ද පෙට්ටි රැගෙන යාමට සහ ජන්ද විමසීමෙන් පසු එම ජන්ද පෙට්ටි ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත භාරදීම සඳහා ආපසු රැගෙන ඒමට යොදා ගනු ලැබී නම් පමණි.

04.02. තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුල ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් පත්වීමක් ලැබූ නිලධාරියෙකුගේ නිවස එම දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත්තේ නම් හා ඔහු එහි පදිංචිව සිට සේවයට පැමිණෙන්නේ නම් (නිළධාරියා පදිංචි ස්ථානය ඔහුගේ සේවා ස්ථානයේ ප්‍රධානියාගේ සහතික කිරීමට යටත්ව) නිළධාරියා ගමන පිටත් වූ ස්ථානය නිවස සේ සලකා ඔහුට නියමිත ජන්ද මධ්‍යස්ථානය දක්වා හා ආපසු තම නිවස දක්වා ගමන් කිරීමට සැතපුම් ගාස්තු ගෙවීමට ඉඩදිය හැකිය.

**මෙලෙස වාහන රැගෙන එන ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරුන්ට කරනු ලබන ගෙවීම් මැතිවරණ කාර්යාල වලින් පමණක් කළ යුතු අතර,** වෙනත් කාර්යාල මගින් ගෙවීම් කර ප්‍රතිපූර්ණ කරවා ගැනීමට උපදෙස් නොදිය යුතුය. වෙනත් කාර්යාල වලින් ගෙවා ප්‍රතිපූර්ණයට කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවද කරුණාවෙන් සලකන්න. ගෙවීම් සම්බන්ධ විධිමත් උපදෙස් ඇතුලත් චක්‍රලේඛයක් ජන්ද විමසීම නිමවීමෙන් පසු නිකුත් කරනු ඇත.

## <u>05. කුලී පදනම මත වාහන ලබා ගැනීම.</u>

05.01 රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා සතු වාහන සංඛ්‍යාව සීමිත වීමත් දුර බැහැර දිස්ත්‍රික්ක වලින් වාහන ලබා දුන්විට එම දිස්ත්‍රික්කවල සිට අදාල දිස්ත්‍රික්කයට යාම සඳහා ධාවනය කිරීමට සිදුවන කිලෝමීටර් සංඛ්‍යාව සහ දිස්ත්‍රික්කයට වාර්තා කිරීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ ධාවනය කරනු ලබන කිලෝමීටර් සංඛ්‍යාවට සාපේක්ෂකව සලකා බැලීමේදී දරනු ලබන වියදම් සාධාරණීයකරණය කිරීමට නොහැකි වීම නිසාත් මෙම ජන්ද විමසීමේදී දිස්ත්‍රික්කය තුලින් පෞද්ගලික වාහන වැඩි සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකිවනු පිණිස කටයුතු කළ හැකිය.

05.02 මෙසේ කුලී ගෙවීමේ පදනම මත ලබාගන්නා වාහන හොඳ ධාවන තත්වයේ තිබිය යුතු අතර, කැරළි කෝලාහල හා මහජන කැළඹීම්ද ආවරණය වන පරිදි වූ පූර්ණ රක්ෂණයක් ලබාගෙන ඇති ඒවා විය යුතුය. එසේ වුවද අවශ්‍යතාවය මත තුන්වන පාර්ශවයේ රක්ෂණ සහතිකයක් සහිත වාහන වුව ද ලබාගත හැකිය.

05.03 මෙසේ කුලී ගෙවීමේ පදනම මත ලබාගන්නා වාහන සඳහා ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

| වාහන වර්ගය | කිලෝමීටරයක් සඳහා ගෙවන මුදල | |
|---|---|---|
| | පෙට්‍රල් වාහන සඳහා | ඩීසල් වාහන සඳහා |
| ආසන 08 ට අඩු වාහන සඳහා කිලෝමීටර් 1 කට | රු.40.00 | රු.34.00 |
| ආසන 08-14 වාහනසඳහා කිලෝමීටර් 1 කට | රු.46.00 | රු.39.00 |
| ආසන15-25 අතර වාහන සඳහා කිලෝමීටර් 1 කට | රු.54.00 | රු.45.00 |
| ආසන 26-39 අතර වාහන සඳහා කිලෝමීටර් 1 කට | ---------- | රු.53.00 |
| ආසන 40 හෝ වැඩි වාහන සඳහා කිලෝමීටර් 1 කට | ---------- | රු.63.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කළ වේලාවේ සිට වාහනය නිදහස් කළ වේලාව දක්වා මුළු කාලයට පහත සඳහන් පරිදි රඳවා ගැනීමේ ගාස්තුවක් ගෙවිය හැක.

ආසන 08 ට අඩු වාහන සඳහා පැයකට රු. 15.00
ආසන 08 හෝ ඊට වැඩි වාහන සඳහා පැයකට රු.25.00
කුලියට ගනු ලබන වාහන එසේ කුලියට ලබාගත් **මුළු කාලය තුළදී** යටත් පිරිසෙයින් කිලෝමීටර 50 ක් හෝ ධාවනය නොවූ අවස්ථාවලදී එම වාහන වලට කිලෝමීටර 50 ක් සඳහා වූ අවම ගාස්තුවක් ගෙවිය හැක.

තවද ප්‍රවාහන සේවා සැපයීම සඳහා වාහන තෝරා ගතහොත් ඒවා සාමාන්‍යයෙන් නවතා තබන ස්ථාන වල සිට වාර්තා කළ යුතු ස්ථානය දක්වා රැගෙන ඒමට සහ ආපසු රැගෙන යාමට **(දිස්ත්‍රික්කය තුළ)** ධාවනය කරන දුර ප්‍රමාණය සඳහාද 05.03 ඡේදයේ සඳහන් පරිදි ගාස්තු ගෙවිය හැක.
එහෙත් වාහනයක් කිසියම් රාජකාරියක නිරත කරවීමට අපේක්ෂා කළ අවස්ථාවක කාර්මික දෝෂයක් හෝ වෙනත් හේතුවක් හෝ නිසා ධාවනය කළ නොහැකි වී නම් එවැනි වාහන සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය.

05.05 **කුලී පදනම මත ලබාගන්නා වාහන යොදාගත හැක්කේ ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා සමඟ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඡන්ද පොළවල් වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීම සඳහා සහ අවශ්‍ය දිස්ත්‍රික්කවල ඡන්ද පොළ කාර්ය මණ්ඩලය තේරීම් භාර නිලධාරී කාර්යාලයේ සිට ඡන්ද පොළ වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීමටද අවශ්‍යතාවය මත කළාප භාර තේරීම් භාර නිලධාරීන්ට වෙන්කර දීම සඳහා ද පමණි. තව ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් / කළාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන සඳහා කිසිසේත්ම කුලී පදනම මත ගෙවීම් නොකළ යුතුය.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංචිතයන්හි රඳවා ගන්නා ලද නිලධාරීන් ඡන්ද පොල වෙත යැවීමට හා ගණන් කිරීමේ නිලධාරීන් ප්‍රවාහනය කිරීම හැර වෙනත් කිසිම කටයුත්තකට කුලී පදනම මත ලබා ගන්නා වාහන යොදා නොගත යුතුය.

05.06 වාහන සංචිත පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත වාහන ලබා නොගත යුතුය. මැතිවරණයට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද සථානාධිපතිවරුන් සහ ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් බලා පිටත් කර හැරීමෙන් පසු ඉතිරි වූ සියළු කුලී වාහන (කළාප භාර තේරීම් භාර නිලධාරීන් සඳහා යොදා ගැනීමට අපේක්ෂිත වාහන හැර) නිදහස් කර ආපසු යැවිය යුතුය. **ඡන්ද පොළ කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා යොදා ගනු ලැබූ කුලී වාහන ඡන්ද විමසීම අවසානයේ තේරීම්භාර නිලධාරී කාර්යාලය වෙත ආපසු පැමිණි පසු වෙනත් කාර්යයක නොයොදා හැකි ඉක්මණින් නිදහස් කර යැවිය යුතුය.**

## 06. ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම

06.01 පාර්ලිමේන්තු මැතිවරණයේ කාර්ය මණ්ඩලය ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍යයන් ප්‍රවාහනය කිරීම හා අවතැන් ඡන්ද දායකයින්ට සිය ඡන්ද පොළ වෙත යාමට හා ආපසු පැමිණීම සඳහාද ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයෙන් පොදු ගාස්තු ක්‍රමයක් යටතේ බස්රථ ලබාගත හැකිය. ඒ පිළිබඳව අවශ්‍ය උපදෙස් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබා දී ඇත. ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ප්‍රමාණය ශ්‍රී

ලංකා ගමනා ගමන මණ්ඩලයේ ආසන්නතම ඩිපෝවෙන් සපයා දීමට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය කටයුතු යොදනු ඇත. ඒ සඳහා සමීපතම ඩිපෝවේ ඩිපෝ අධිකාරී, ධාවන කළමනාකරු සමඟ සාකච්ඡා කර අවශ්‍ය බස්රථ ප්‍රමාණය ලබා ගැනීමට කරුණාකර කටයුතු කරන්න. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලබා ගන්නා බස් රථ සඳහා ගෙවීම් කිරීමේදී පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් මත ගෙවීම් කිරීමට කටයුතු කරන්න.

| **ආසන 42 හෝ ඊට වැඩි බස්රථ සඳහා.** | **පැය 12 අඩු කාලයකට මුදා හරින** | **පැය 12 ට වැඩි කාලයකට මුදා හරින** |
|---|---|---|
| කුලි ගාස්තු | රු. 8000/- | රු. 9000/- |
| උපරිම කි.මී ගණන | 100 | 125 |
| උපරිම කි.මී. ගණන ඉක්මවු විට | රු. 60/- | රු. 60/- |

| **ආසන 32 හෝ ඊට වැඩි බස්රථ සඳහා.** | **පැය 12 අඩු කාලයකට මුදා හරින** | **පැය 12 ට වැඩි කාලය සඳහා මුදා හරින** |
|---|---|---|
| කුලි ගාස්තු | රු. 6000/- | රු. 7000/- |
| උපරිම කි.මී ගණන | 100 | 125 |
| උපරිම කි.මී. ගණන ඉක්මවු විට කි. මීටරයකට | රු. 60/- | රු. 60/- |

**පැය 24 කාලයක් ඉක්මවු විට රඳවා ගැනීමේ ගාස්තු පැය 1 කට රු. 400 කි.**

06.02 ඡන්ද ගණන් කිරීමේ කටයුතු අවසාන වීමෙන් පසු එම කාර්ය මණ්ඩලය දුම්රිය ස්ථාන හෝ බස් නැවතුම් පළවල් හෝ වෙත යැවීමට රජයේ වාහන නොමැති අවස්ථා වලදී පමණක් දිස්ත්‍රික්ක තුල ප්‍රවාහන පහසුකම් සුදුසු සලසා දීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ කිහිපයක් ගෙන්වා තබා ගැනිම සුදුසු වනු ඇත. එහෙත් එම බස් රථ කුමන හේතුවක් නිසාවත් දිස්ත්‍රික්කයෙන් බැහැර ධාවනයට නොයෙදිය යුතුය.

## <u>07. පෞද්ගලික බස්රථ සංගම් වලින් ලබා ගන්නා බස්රථ</u>

07.01 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ වලට අමතරව ලංකා පෞද්ගලික බස්රථ සංගමයෙන් ද ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ලබා දීමට වැඩ පිළිවෙලක් සකස් කර ඇත.

මේ සම්බන්ධයෙන් ලංකා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයේ සභාපති සමග 2010.02.22 දින පැවැති සාකච්ඡාවේ දී පහත සඳහන් නිගමනයන්ට එළඹෙන ලද අතර ඒ අනුව පෞද්ගලික බස්රථ ලබා ගැනිමට හා ගෙවීම් කිරිමට කටයුතු කරන්න.

(I) ආසන 42 හෝ ඊට වැඩි බස් රථයක් දිස්ත්‍රික්කය තුල ධාවනයේ දී දිනකට

| | | |
|---|---|---|
| කි.මී. 50 දක්වා | - | රු. 5000/- |
| කි.මී. 50 සිට 75 දක්වා දිනකට | - | රු. 6500/- |
| කි.මී. 75 සිට 100 දක්වා දිනකට | - | රු. 7500/- |
| කි.මී. 100 සිට 125 දක්වා දිනකට | - | රු. 8500/- |

(II) ආසන 25 සිට 29 දක්වා බස්රථයක් දිස්ත්‍රික්කය තුල ධාවනයේ දී දිනකට

| | | |
|---|---|---|
| කි.මී. 50 දක්වා | - | රු. 4000/- |
| කි.මී. 50 සිට 75 දක්වා දිනකට | - | රු. 5500/- |
| කි.මී. 75 සිට 100 දක්වා දිනකට | - | රු. 6500/- |
| කි.මී. 100 සිට 125 දක්වා දිනකට | - | රු. 7500/- |

(III) ආසන 30 සිට 40 දක්වා බස්රථ දිනකට දිස්ත්‍රික්කය තුළ ධාවනය

| | | |
|---|---|---|
| කි.මී. 50 දක්වා | - | රු. 4500/- |
| කි.මී. 50 සිට 75 දක්වා දිනකට | - | රු. 6000/- |
| කි.මී. 75 සිට 100 දක්වා දිනකට | - | රු. 7000/- |
| කි.මී. 100 සිට 125 දක්වා දිනකට | - | රු. 8000/- |

**(IV)** පොද්ගලික බස්රථ සඳහා රියදුරු පමණක් සේවයේ නිරත කරවනු ඇත. ඉහත ගෙවීම් වලට අමතරව රියදුරුට දිනකට රු350.00 යැපීම් දීමනාවක් ගෙවිය යුතුය.

**(V) ඉන්ධන ලබා දීම හෝ රඳවාගැනීමේ ගාස්තු කිසිවක් ගෙවනු නොලැබේ.**

**(VI)** බස් රථ ලබා ගත යුත්තේ අදාල දිස්ත්‍රික්කය තුල ගාල් කරනු ලබන ඒවායින් පමණි.

**(VII)** මෙම බස් රථ ලබා ගැනීමේ දී ඡන්ද විමසීම් දිනට පෙර දින (2010.04.07 දින ) උදෑසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගෙන ඡන්ද විමසීම අවසන් වී ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ඡන්ද පෙට්ටි භාර දුන් වහාම නිදහස් කර යැවිය යුතුය (එවිට ගෙවීම් කිරීමට සිදුවනුයේ දින දෙකකට කුලී ගාස්තුව සහ දින දෙකකට රියදුරු යැපීම් දීමනාව පමණි.)

07.02 **වව්නියාව හා යාපනය අවතැන් වූ ඡන්දායකයන් පොකුරු ඡන්ද මධ්‍යස්ථාන වෙත රැගෙන යාම සහ ආපසු රැගෙන ඒම වෙනුවෙන්** ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා ඡන්ද විමසීම් දින යොදා ගනු ලබන පෞද්ගලික බස් රථ සඳහා TR /02/ (03) හා 2010.02.16 දිනැති චක්‍රලේඛය පරිදි ධාවනය කරන දුර ප්‍රමාණය සහ ආසන ගණන පදනම් කර ගනිමින් ගෙවීම් කළ හැකිය. ඔවුන් සඳහා ඉහත සඳහන් I, II, III හා IV හි සඳහන් ගාස්තු කිසිවක් අදාළ නොවේ.

07.03 යාපනය දිස්ත්‍රික්කය සඳහා පමණක් පෞද්ගලික බස්රථ 2010.04.06 දින සවස ගෙන්වා ගත හැකි අතර ගෙවිය යුතු අවම මුදලේ අර්ධය එදිනට ගෙවිය හැකිය.

07.04 ඡන්ද විමසීම් දිනට පෙර දින රාත්‍රියේ අදාල ඡන්ද මධ්‍යස්ථානයන් හි බස් රථ ගාල් කර තැබිය යුතුය.බස් රථ සඳහා කොන්දොස්තරවරයා ගේ සහාය ලබා නොගන්නා හෙයින් රථය හැසිරවීමට අවශ්‍ය විටක දී ඡන්ද මධ්‍යස්ථානයේ කා.කා.ස. ගේ හෝ ආරක්ෂක නිලධාරීන් ගේ සහාය ලබා දෙන ලෙසට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් දැනුවත් කළ යුතුය.

07.05 ඉහත ආකාරයෙන් ලබා ගන්නා බස් රථ සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින්ම අදාල ගෙවීම් කටයුතු සිදු කළ යුතුවේ.කිසි විටෙකත් මේ සඳහා ප්‍රධාන කාර්යාලය මගින් ගෙවීම් නොකරනු ලබන අතර ඒ පිළිබඳව අදාල බස් රථ හිමියන් ද දැනුවත් කිරීමට කටයුතු කරන්න.

මීට අදාළ වැඩිපුර උපදෙස් සඳහා TR/02(09) හා 2010.02.26 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය කරුණාකර බලන්න

## 08. වතු සමාගම්වලින් ලබා ගන්නා වාහන

වැවිලි සමාගම් වෙත පාලනය භාර දී ඇති වතුවල වාහන නඩත්තු කරනුයේ එම සමාගම් විසින් හෙයින් එම වතු සමාගම්වලට අයත් වාහන රාජ්‍ය ආයතනවල වාහන සේ මැතිවරණ රාජකාරීවලට ලබා දීමට නොහැකි බැව් එම වැවිලි සමාගම්හි පාලනාධිකාරිය විසින් මා වෙත දන්වා ඇත. උක්ත වාහන පෞද්ගලික අංශයෙන් නඩත්තු කෙරෙන හෙයින් එම වාහන ද පෞද්ගලික අංශයෙන් කුලියට ලබා ගන්නා වාහන සේ සලකා මෙම චක්‍රලේඛයේ 06 උපවගන්තියේ සඳහන් පරිදි ගෙවීම් කළ යුතුවේ. ධාවනය කරන සැතපුම් ප්‍රමාණය අනුව ගාස්තු ගෙවීමට සිදුවන හෙයින්, වතු සමාගම්වල වාහන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හෝ ඡන්ද පොළ වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීමේ කාර්යයට පමණක් යෙදිය යුතුය. එම වාහනවලට අදාල ගෙවීම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී කළ යුතු අතර, ඔවුන්ගේ ගෙවීම් පිළිබඳ ඉල්ලීම් මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් නොකළ යුතු බවට උපදෙස් දිය යුතුය.

## 09. සංස්ථා, මණ්ඩල හා බැංකුවල වාහන

සංස්ථා, මණ්ඩල හා බැංකු ආදියෙහි වාහන වෙනුවෙන් කුලී ගෙවීමක් හෝ සැතපුම් ගාස්තු ගෙවීමක් හෝ නොකෙරෙන නමුත්, එම රියැදුරන්ට ගෙවන අතිකාල ගාස්තු ප්‍රමාණය රජයේ දෙපාර්තමේන්තුවල රියදුරන්ට ගෙවන ගාස්තු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයකින් වැඩිවේ. එහෙයින් වියදම් අඩු කර ගැනිම සඳහා එම **වාහන ඡන්ද විමසීම පැවැත්වෙන දිනට , දිනකට පෙර සේවයට කැඳවීමට ද ඡන්ද විමසීම් දිනට පසුදින පෙරවරුවේම සේවයෙන් නිදහස් කිරීමට ද කටයුතු කළ යුතුය.මෙම වාහන මැතිවරණයෙන් පසු ඇති අවශ්‍යතා සඳහා යොදවා ගැනිමට තබා නොගත යුතුය.**

## 10. කුලී පදනම මත ධාවනය කරන වාහන සඳහා ධාවන සටහන් පවත්වා ගැනීම

කුලී පදනම මත ධාවනය කරනු ලබන පෞද්ගලික වාහන සහ වතු සමාගම්වලට අයත් වාහන සම්බන්ධයෙන් එම එක් එක් වාහනය වෙනුවෙන් ධාවන සටහන් පිළියෙළ කළ යුතුය. එය රජයේ වාහනවල ධාවන විස්තර සටහන් කිරීමට යොදා ගන්නා පොදු 268 ආකෘතියෙහි වූ ධාවන සටහන් පත්‍රයට අනුරූප විය යුතුය. ගමනේ යෙදෙන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නම හා ස්ථිර තනතුර සටහන් කිරීමට ද , ඔහුගේ සම්පූර්ණ අත්සන් යෙදීමට ද එම ආකෘතියේ ඉඩ සැලසිය යුතුය.

## 11. තැපැල් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාහන

නිල ඡන්ද දැන්වීම් පත් බෙදා හැරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ වාහන ප්‍රමාණවත් නොවිය හැකි අතර , එම කාර්යයට වාහන ඉල්ලා සිටියහොත් රජයේ වාහන කිහිපයක් සපයා දීම මැනවි. **එහෙත් එම වාහනවලට අවශ්‍ය ඉන්ධන, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා තැපැල් දෙපාර්තමේන්තුවෙන් දැරිය යුතුය.** ඡන්ද විමසීමට අදාලව තැපැල් දෙපාර්තමේන්තුව ඉටු කරන රාජකාරී සඳහා මවිසින් තැපැල් දෙපාර්තමේන්තුවට මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර උපදෙස් TR/02(06) හා 2010.02.19 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මගින් මවිසින් නිකුත් කර ඇත.

## 12. පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාහන

ඡන්ද විමසීමේ ආරක්ෂක කටයුතු ඉටුකිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වනු ඇත. **තේරීම් භාර නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබේනම් පමණක්** පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා රජයේ වාහන ලබා දීම මැනවි. (දිස්ත්‍රික්කයෙන් බාහිරව වාහන ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එසේ ලබාදීම අවශ්‍ය නොවේ) **මෙසේ ලබා දෙන වාහනවලට අවශ්‍ය ඉන්ධන සහ රියදුරන්ගේ අතිකාල සහ සංයුක්ත දීමනා මවිසින් පොලිස් දෙපාර්තමේන්තුවට වෙන් කර දී ඇති ප්‍රතිපාදන වලින් දැරිය යුතුවේ.** එසේ රජයේ වාහන සපයා දීමට නොහැකි අවස්ථාවක දී , පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඒ බව දැන්විය යුතු අතර, පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා පොලිස්පතිගේ උපදෙස් අනුව ඔවුන් හට කුලී පදනම මත වාහන ලබා ගත හැකිය. **එසේ ලබා ගන්නා වාහනවලට කුලී ගෙවීම් සිදු කරනුයේ ද එම දෙපාර්තමේන්තුව විසින්මය.** පසුගිය ඡන්ද විමසීම් වලදී දිස්ත්‍රික්ක කිහිපයක පොලිස් නිලධාරීන්ට අවශ්‍ය වාහන තේරීම් භාර නිලධාරීන් විසින් කුලී ගෙවීමේ පදනම මත ලබා ගත් වාහන අතුරින් සපයා දීම නිසා ගෙවීම් සමබන්ධයෙන් ගැටළු ඇතිවිය. මෙම ඡන්ද විමසීමේදී එවැනි ගැටළු ඇති නොවීමට පූර්ව විධිවිධාන යෙදිය යුතුය. තවද **පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කුලී වාහන ලබා දීමට තේරීම් භාර නිලධාරියා මැදිහත් වන්නේ නම්, එම වාහන වලට කුලී ගෙවනුයේ පොලිස් දෙපාර්තමේන්තුවෙන් බවටද එම ගෙවීම් සම්බන්ධ සියළුම විමසීම් හා පැමිණිලි පොලිස්පතිවරයා හෝ ඔහුගේ නිලධාරීන් හෝ වෙත ඉදිරිපත් කළ යුතු බවටද වාහන හිමියන් දැනුවත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර උපදෙස් TR/02(06) හා 2010.02.19 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් ඔබ වෙත ලබාදී ඇත.**

## 13. ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා අවශ්‍ය වාහන

ඡන්ද විමසීමේදී යුධ හමුදාව කිසියම් කාර්යයකට කැඳවන්නේ නම්, ඒ පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ සහායට විය යුතුය. එහෙයින් හමුදා අවශ්‍යතා සඳහා වාහන සැපයීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතු අතර, ගෙවීම් පිළිබඳ වගකීමද, එම දෙපාර්තමේන්තුවට පැවරේ.

14. රජයේ වාහන ඡන්ද විමසීම් රාජකාරී වලට අදාල නොවන පෞද්ගලික ගමන්වල යෙදීම, **ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් රැගෙන එන වාහන සඳහා කුලී පදනම මත ලබාගන්නා ලද වාහන සඳහා වු ගාස්තු මත ගෙවීම් කිරීම ,** සාවද්‍ය අන්දමින් නිලධාරීන්ට සැතපුම් ගාස්තු ගෙවීම, මගේ අනුමැතියෙන් බැහැර කටයුතු වලට කුලී පදනම මත ලබාගන්නා ලද වාහන යෙදවීම හා සේවයට නොයෙදවු වාහන සඳහා ගෙවීම් කිරීම් සම්බන්ධයෙන් පසුගිය ඡන්ද විමසීම් වලදී පැමිණිලි හා විගණන විමසුම් මාවෙත ඉදිරිපත්ව ඇති අතර ඒවා මාගේ දැඩි අවධානයට යොමුව ඇති බවද සඳහන් කරනු කැමැත්තෙමි. මෙම මැතිවරණයේදී එවැනි අසතුටුදායක තත්වයන් වාර්තා නොවන අන්දමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඔබගේ නිලධාරීන්ට පැහැදිලි කර දෙන්නේ නම් කෘතඥ වන්නෙමි. පිට දිස්ත්‍රික්ක වල මැතිවරණ රාජකාරී සඳහා අනුයුක්ත කොට යවනු ලබන වාහන මැතිවරණ කටයුතු අවසන් වු වහා නිදහස් නොකර ඒවා දින කිහිපයක් පමා කිරීම නිසා මැතිවරණයෙන් පසු තම ආයතනවල රාජකාරී කටයුතු වලට බාධා පැමිණෙන බව රජයේ ඇතැම් දෙපාර්තමේන්තු හා සංස්ථා ප්‍රධානින් මා වෙත පැමිණිලි කර ඇති බවද එම තත්වයන් මත ඔවුන් මැතිවරණ රාජකාරී සඳහා තම කාර්යාලයන්හි වාහන ලබාදීමට මැළිකමක් දක්වන බවද පෙනී ගොස් ඇත. එහෙයින් බැහැර දිස්ත්‍රික්ක වල පිහිටි රාජ්‍ය ආයතන වලින් ගෙන්වා ගනු ලබන වාහන මැතිවරණයට පසු දින පෙරවරුවේම සේවයෙන් නිදහස් කර යැවීමට විධිවිධාන යෙදිය යුතුය. **කොළඹ දිස්ත්‍රික්කයේ සංචිතයෙන් හෝ වෙනත් දිස්ත්‍රික්කයකින් එවනු ලබන රජයේ වාහන කිසිදු හේතුවක් මත පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා ලබා නොදිය යුතුය.**

## 15. ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම.

15.01 ණය පහසුකම් යටතේ පොදු 231 ඇණවුම මගින් ඉන්ධන ලබා ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වේ.

I. අවශ්‍ය ඉන්ධන ඇණවුම් පොත් ගබඩාවෙන් ලබා ගැනීමේදී ඇණවුම් වල සඳහන් අංක පිළිවෙලට පොත් නිකුත් කිරීම හා භාර ගැනීම.

II. පොත් කිහිපයක් එකවර භාවිතා නොකිරීම සහ එක් පොතක් අවසන් වු පසු පමණක් ඊළඟ පොත භාවිතයට ගැනීම.

III. ඉන්ධන ලබා ගැනීම සඳහා අමුණුම 01 ආකෘතිය පරිදි සකසා ගත් අයදුම්පතක් රියදුරන් ලවා සම්පූර්ණ කරවා ගැනීම.

IV. ඉන්ධන නිකුත් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අවශ්‍ය විස්තර එහි ඇතුළත් කිරීම, එසේ ඇතුළත් කරන විස්තර වලට පහත දැක්වෙන තොරතුරුද අඩංගු විය යුතුය. ඉදිරි විගණන කටයුතු සඳහා මෙම තොරතුරු අවශ්‍ය වන හෙයින්, මෙම ලේඛනය ඡන්ද විමසීම නිමවී සති දෙකක් ඇතුළත සහකාර මැතිවරණ කොමසාරිස් භාරයට ගත යුතුය.

- වාහනයේ අංකය
- වාහනය අයත් ආයතනයේ නම හා ලිපිනය
- රියදුරු මහතාගේ නම
- ඉන්ධන ඇණවුම් අංකය
- ඉන්ධන වර්ගය (ඩීසල්ද / පෙට්‍රල්ද )
- නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය
- එන්ජින් ඔයිල් / බ්‍රේක් ඔයිල්
- ඉන්ධන ඇණවුම් අත්සන් කරන මාණ්ඩලික නිලධාරියාගේ කෙටි අත්සන සහ දිනය
- ඉන්ධන ඇණවුම ලබා ගත් රියදුරුගේ අත්සන

15.02 ඉන්ධන ඇණවුම් අත්සන් කිරීම නිලධාරීන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට සීමා කළ යුතුය. ඉන්ධන ඇණවුම් අත්සන් කිරීමට බලය දී ඇති නිලධාරීන්ගේ නම්, නිල නාම, රාජකාරී ලිපිනයන් සහ ආදර්ශ අත්සන් ඉන්ධන හල් හිමියන් වෙත කල් වේලා ඇතිව ලබා දිය යුතුය.

15.03 ණය පහසුකම් යටතේ ඉන්ධන ලබා ගැනීම සඳහා වාහනය රියදුරු සමග පමණක් නොයැවිය යුතු අතර, **සැම විටම කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු සමග යැවිය යුතුය.** අදාළ නිලධාරියා ඉදිරිපිටදී වාහනයේ ටැංකියට ඉන්ධන පිරවූ බවට ඇණවුමේ වම්පස ඉහළ කෙළවරේ සටහනක් යෙදිය යුතුය. මෙම සටහන පහත ආදර්ශය පරිදි රබර් මුද්‍රාවකින් තැබීමට කටයුතු කළ හැක.

මා ඉදිරියේ ඉන්ධන ලීටර් …………….. ක්
ටැංකියට පුරවන ලදී.
මයිලෝ මීටරයේ කියවීම

| | | |
|---|---|---|
| …………………….. | …………………….. | ……………………… |
| දිනය | වේලාව | අත්සන |

සංචිත වාහන වලට (Pool Vehicles) මෙන්ම නිලධාරීන් විසින් රැගෙන එන වාහන (Assigned Vehicles) සඳහා ද ඉන්ධන ලබා දීමේදී මෙම විධිවිධාන අදාළ වේ. වාහන වලට ලබාදුන් ඉන්ධන සඳහා වැයවූ මුදල් ප්‍රතිපූරණය කිරීමේ ආකෘති දෙකක්ද මේ සමඟ අමුණා ඇත. මේ සම්බන්ධ වැඩිදුර උපදෙස් **TR/02(05)** හා 2010.02.17 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මගින් ඔබට ලබාදී ඇත.

## <u>16. හදිසි අනතුරු වලට මුහුණ දෙන වාහන</u>

මැතිවරණ රාජකාරීවල නිරතකරවන ලද වාහනයක් හදිසි අනතුරකට මුහුණ දුනහොත් සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු පරිදිම පොලීසියට වාර්තා කර අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගත යුතුය. ඊට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ද ඇතුළත් විය යුතුය.

I. අනතුර පිළිබඳව නොපමාව ළගම ඇති පොලිසියට දැන්වීම.

II. වාහනය රක්ෂණය කර ඇත්නම්, අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.

III. අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීම.

IV. අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයින් වී නම් ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර වාර්තාවක් ලබා ගැනීම.

V. රථයට සිදුවී ඇති හානි පිළිබඳව මාණ්ඩලික නිලධාරියෙකු ලවා පරීක්ෂා කරවීම.

අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන අප දෙපාර්තමේන්තුවේ වැය ශිර්ෂ වලින් දරනු ලබන්නේ නම් ඉහත 1 ජේදයේ සඳහන් ලිපි ලේඛනවලට අමතරව පහත සඳහන් විස්තරද අප වෙත සැපයිය යුතුය.

I. රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්

II. දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් සමග දළ ඇස්තමේන්තුවක්

III. පොලිස් වාර්තාවේ සහතික කළ පිටපතක්

එමෙන්ම අනතුර පිළිබඳව මා වෙතද වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා / ප්‍රවාහන නිලධාරී වෙතද නොපමාව දැනුම් දිය යුතුය. තවද එවැනි අනතුරු පිළිබඳව ඔබට ද නොපමාව වාර්තා කරන ලෙස ප්‍රවාහන කටයුතු භාර නිලධාරීන්ට දැනුම් දෙන්න. මේ සම්බන්ධ **TR/02(07)** හා 2010.02.19 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය කරු. බලන්න.

## 17. <u>මැතිවරණ රාජකාරී අතරතුරදී කාර්මික දෝෂ වලට ලක්වන රජයේ වාහන</u>

17.01 මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස කැඳවන ලද රජයේ වාහනයක් හෝ නිලධාරීන් විසින් රැගෙන එන ලද රජයේ වාහනයක් හෝ කාර්මික දෝෂයකට ලක්වුවහොත් එම වාහනය අළුත්වැඩියා කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

01. කාර්මික දෝෂය හා කළ යුතු අළුත්වැඩියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ වාර්තාවක් ලබා ගැනීම.

02. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අනුමත ගරාජ 03 කින් මිළ ගණන් ලබා ගැනීම

03. මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ හා නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ නිර්දේශ සමඟ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවා මාගේ අනුමැතිය ලබා ගැනීම.

17.02 අළුත්වැඩියාව නිමවීමෙන් පසු අළුත්වැඩියාව පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ වාර්තාව සමඟ අවසාන බිල්පතේ පිටපතක් ප්‍රධාන කාර්යාලයට එවීම. (වැඩිදුර විස්තර සඳහා චක්‍රලේඛ අංක TR-02(01) බලන්න.

18. **පහත සඳහන් ඇමුණුම් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවමි.**

- ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් හා කළාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන් විසින් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු ලබාදීමේ ආකෘතිය (V - 1)
- ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් / තම පෞද්ගලික වාහනය සඳහා පෞද්ගලික රියදුරු මහතෙකු යොදවා ගැනීම පිළිබඳ තොරතුරු (V-1 A)
- නිලධාරීන් රැගෙන යන වෙන් කල වාහන / සංචිත වාහන සඳහා ලබාදුන් ඉන්ධන වියදම ප්‍රතිපුරණය කිරීමේ ආකෘතිය (PV1, AV1)
- සංචිත හා වෙන්කළ වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීම (V 2)
- සංචිත වාහන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදවීම පිළිබඳ විස්තර පත්‍රිකාව (V-3)
- ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් රැගෙන එන පෞද්ගලික වාහන තොරතුරු
- සංචිත වාහන රියදුරන්ගේ පැමිණීමේ සහතිකය CE-51 ආකෘතියේ පිටපතක්

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 1. යුධ හමුදාපති. - දැනගැනීම සඳහා කාරුණිකව
2. පොලිස්පති. - දැනගැනීම සඳහා කාරුණිකව
3. පෝස්ට් මාස්ටර් ජනරාල්. - දැනගැනීම සඳහා කාරුණිකව
4. විගණකාධිපති - දැනගැනීම සඳහා කාරුණිකව
5. සභාපති, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය - මෙම චක්‍රලේඛයේ 06 ඡේදය පරිදි අවශ්‍ය බස්රථ ලබාදීමට කරුණාකර කටයුතු කිරීම සඳහා.
6. ගණකාධිකාරී (මුදල්) - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
7. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා

# පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.

# ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන එන

# පෞද්ගලික වාහන තොරතුරු.

1. නිලධාරියාගේ නම : ......................................................................................................
2. කාර්යාලීය ලිපිනය : ......................................................................................................
3. පෞද්ගලික ලිපිනය : ......................................................................................................
4. ඔබ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වශයෙන් පත් කර ඇති දිස්ත්‍රික්කයේ නම : ...........................................................................................
5. ඔබගේ පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු (ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

   වාහනයේ අංකය : ......................................................................................................

   වර්ගය : ......................................................................................................

   පෙට්‍රල් ද ඩීසල් ද යන්න: ......................................................................................................

   වාහනය පදවන රියදුරුගේ නම : ..........................................................................................

   ලිපිනය : ......................................................................................................

   රියදුරු බලපත් අංකය : ......................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මැතිවරණ කොමසාරිස්ගේ TR-2 (11) හා 2010.03.03 දිනැති චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි හා කිලෝමීටරයට රු. 15/- හා සැතපුමකට රු. 24/- යන ගාස්තු ප්‍රමාණයන් යටතේ ගාස්තු ලබා ගැනීමට එකඟ වෙමි.

දිනය : ................................ නිලධාරියාගේ අත්සන

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වශයෙන් තෝරාගෙන ඇති ඉහත සඳහන් නිලධාරියාට අයත් අංක .......................... දරණ වාහනය ඡන්ද පොළ රාජකාරී සඳහා යොදා ගැනීමට අනුමැතිය දෙන ලදී.

.........................................................

දිනය : සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)

**සැළකිය යුතුයි : නිලධාරියා විසින් මෙම ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතු අතර ඔහු ඉන් එක් පිටපතක් නිලධාරියාට ආපසු භාරදෙනු ඇත. එය සැතපුම් කුලිය ඉල්ලුම් කිරීමේදී වවුචරයට අමුණා තිබිය යුතුය.**

**AV 01**

# පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08
## ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / සහකාර තේරීම් භාර නිලධාරී විසින් රැගෙන යන ලද නිල වාහන (Assigned Vehicles) වලට සැපයූ ඉන්ධන සඳහා වැය වූ මුදල් ප්‍රතිපූරණය කිරීම

දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ / ආයතනයේ නම : ෆැක්ස් අංකය :

ලිපිනය : දුරකථන අංකය :

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිලධාරියාගේ නම** | **තනතුර** | **ඡන්ද විමසීම් රාජකාරි වල නිරත වූ දිස්ත්‍රික්කය හා වාර්තා කළ දිනය** | **වාහන අංකය** | **ඉන්ධන වර්ගය (ඩීසල් පෙට්‍රල්)** | **ඉන්ධන දැවීම (ලීටරයට කි.මී.)** | **ඡන්ද විමසීම් කටයුතු සඳහා ධාවනය කළ කි.මී. ගණන** | **තේරීම් භාර නිලධාරී වෙතින් ලබා ගත් ඉන්ධන ප්‍රමාණය** | **ඔබ ආයතනයෙන් සැපයූ ඉන්ධන ප්‍රමාණය ලීටර්** | **ප්‍රතිපූරණය සඳහා ඉල්ලා සිටින මුදල** | |
| | | | | | | | | | **රු** | **ශත** |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / මණ්ඩලයේ ඉහත සඳහන් නිලධාරියා/නිලධාරීන් විසින් ඡන්ද විමසීම් කටයුතු සඳහා මෙම වාහනය/වාහන රැගෙන ගිය බවත්, එය ඔහුගේ/ඔවුන්ගේ නිල වාහනය බවත්, ඉහත විස්තර සඳහන් ඉන්ධන ප්‍රමාණයන් ඒ වෙනුවෙන් සපයන ලද බවත් සහතික කරමි.මෙම මුදල ප්‍රතිපූරණය කිරීම සඳහා ............................................................... නමින් චෙක්පත ලියා එවන්න.

දිනය :

...........................................................

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා /

ප්‍රවාහන කටයුතු භාර නියෝජ්‍ය ප්‍රධානියා.

නම සහිත නිල මුද්‍රාව තබන්න.

# පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08
## ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී /සහකාර තේරීම් භාර නිලධාරී විසින් රැගෙන යන ලද සංචිත වාහන (Pool Vehicles) වලට සැපයු ඉන්ධන සඳහා වැය වු මුදල් ප්‍රතිපුරණය කිරීම

දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ / ආයතනයේ නම : ෆැක්ස් අංකය :

ලිපිනය : දුරකථන අංකය :

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිලධාරියාගේ නම | තනතුර | ජන්ද විමසීම් රාජකාරි වල නිරත වු දිස්ත්‍රික්කය හා වාර්තා කළ දිනය | වාහන අංකය | ඉන්ධන වර්ගය (ඩීසල් පෙට්‍රල්) | ඉන්ධන දැවීම (ලීටරයට කි.මී) | ජන්ද විමසීම් කටයුතු සඳහා ධාවනය කළ කි.මී. ගණන | තේරීම් භාර නිලධාරී වෙතින් ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | ඔබ ආයතනයෙන් සැපයු ඉන්ධන ප්‍රමාණය ලීටර් | ප්‍රතිපුරණය සඳහා ඉල්ලා සිටින මුදල | |
| | | | | | | | | | රු | ශත |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / මණ්ඩලයේ ඉහත සඳහන් නිලධාරියා/නිලධාරීන් විසින් ජන්ද විමසීම් කටයුතු සඳහා ඉහත සඳහන් වාහනය/වාහන 2010 ...................... දින රැගෙන ගිය බවත්, එය දෙපාර්තමේන්තුවේ සංචිත වාහනයක්/වාහන බවත් , ඉහත විස්තර සඳහන් ඉන්ධන ප්‍රමාණයන් ඒ වෙනුවෙන් සපයන ලද බවත් සහතික කරමි.මෙම මුදල ප්‍රතිපුරණය කිරීම සඳහා ................................................................ නමින් චෙක්පත ලියා එවන්න.

දිනය :

..........................................................

අමාත්‍යංශ / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා /

ප්‍රවාහන කටයුතු භාර නියෝජ්‍ය ප්‍රධානියා.

නම සහිත නිල මුද්‍රාව තබන්න.

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.</u>**

**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු.</u>**

01.
- (I) නිලධාරීගේ නම :
- (II) ස්ථිර තනතුර :
- (III) කාර්යාලයේ ලිපිනය :

02.
- (I) රැගෙන එන ලද වාහනයේ අංකය :
- (II) පෙට්‍රල්ද ඩීසල්ද යන වග :
- (III) වාහනය තමාගේද/කලත්‍රයාගේද යන වග :

(සනාථ කිරීමට ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් මීට අමුණන්න)

03.
- (I) ඡන්ද විමසීමේ රාජකාරී ස්වාභාවය :

  ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / සහකාර තේරීම් භාර නිලධාරී.
- (II) දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කල

  දිනය : වේලාව :

මම 2010.04..........දින ඉහත අංක දරණ වාහනයෙන් * .................................. දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පැමිණි බව සහතික කරමි.

දිනය : .............................. සම්පූර්ණ අත්සන : ..........................

(නිලධාරියාගේ නම සහිත නිල මුද්‍රාව)

= = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = = =

**ආ කොටස**

ඉහත නම සඳහන් නිලධාරී ................................................ මහතා/මහත්මිය අංක ......................... දරණ වාහනයෙන් පැමිණි බවට මම පෞද්ගලිකවම සෑහීමකට පත්වෙමි. ඔහු 2010.04...... දින ..................... වේලාවට මා වෙත වාර්තා කළ බවත් 2010.04.......... දින ............................ වේලාවට එම වාහනයෙන්ම ආපසු පිටත්ව ගිය බවත් සහතික කරමි.

සම්පූර්ණ අත්සන : දිනය :

සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)

(නම සහිත නිල මුද්‍රාව තබන්න)

සැ.යු. : ***පෞද්ගලික වාහන රැගෙන එන සෑම නිලධාරියෙකු විසින්ම තමන් පැමිණි වහාම මෙම ආකෘතිය සම්පූර්ණ කර තම වාහනයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක්ද සමඟ සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය.*** *ආපසු පිටත්ව යාමට ප්‍රථම මෙහි ආ කොටස සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) ලවා සම්පූර්ණ කරවාගෙන ලබාගත යුතුය.*

( * - අනවශ්‍ය වචන කපා හරින්න. )

පිටපත් දෙකකින් සම්පූර්ණ කර සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදෙන්න.

V 1 (A)

**පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.**

**ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරීන් / පෞද්ගලික රියදුරු මහතෙකු යොදවා ගැනීම පිළිබඳ තොරතුරු.**

01. වාහනය අයිති නිලධාරියාගේ නම : .................................................................................
02. තනතුර : .................................................................................
03. දෙපාර්තමේන්තුවේ නම හා ලිපිනය : .................................................................................
04. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්කරනු ලැබූ දිස්ත්‍රික්කයේ නම : .................................................................................
05. රැගෙන ආ වාහනයේ අංකය : .................................................................................
06. වාහනයේ රියදුරු වශයෙන් යොදවා ගත් අයගේ නම : .................................................................................
07. ඔහුගේ ලිපිනය : .................................................................................
08. ජාතික හැඳුනුම්පත් අංකය : .................................................................................
09. රියදුරු බලපත් අංකය : .................................................................................
10. රියදුරු මහතාගේ අත්සන : .................................................................................

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් ............................................ දිස්ත්‍රික්කයේ රාජකාරී සඳහා පැමිණි මම අංක .......................... දරණ වාහනයේ රියදුරු ලෙස ........................................................ මහතා යොදා ගත් බව සහතික කරමි.

.....................................................................

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී /

ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරියාගේ අත්සන

---

**ආ කොටස**

ඉහත නම් සඳහන් නිලධාරී මහතාට අයත් අංක ............................. දරණ වාහනයේ රියදුරු ලෙස ....................................................... මහතා පැමිණි බව සහතික කරමි.

.....................................................................

සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)

(නම සහිත නිල මුද්‍රාව තබන්න)

සැළකිය යුතුයි -: රියදුරු මහතා ලවා මෙම ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර ලබාගන්න. ඔබ විසින් සහතික කර ඉන් එක් පිටපතක් රියදුරුට ආපසු භාර දෙන්න. එය ඔහුගේ ගමන් වියදම් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.

# පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08

## පොදු 231 ඉන්ධන ඇනවුම් මගින් සංචිත වාහන වලට / නිලධාරීන් රැගෙන එන වෙන්කළ වාහන වලට ඉන්ධන නිකුත් කිරීම. ( Pool Vehicles / Assigned Vehicles)

01. වාහන අංකය : ……………………………..........……......…………………
02. වාහනය අයත් ආයතනය : ……………………………………………......………..
03. මාණ්ඩලික නිලධාරියෙකු රැගෙන එන වාහනයක් නම් ඔහුගේ නම : .......................................
04. තනතුර : .......................................................................................................................
05. රියදුරුගේ නම : ……………………………………….....……………………….
06. මයිලේජ් මීටරය කියවීම : ……………………………………………………......…...
07. අවශ්‍ය ඉන්ධන වර්ගය (පෙට්‍රල් ද ඩීසල් ද යන්න) : ……………………………….....
08. ඉන්ධන දැවීම ලීටරයට කිලෝමීටර් : ……………………………………………........
09. දැනට ටැංකියේ ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් : ……………………………....….......
10. ටැංකියේ අල්ලන ඉන්ධන ප්‍රමාණය ලීටර් : ……………………………………....…
11. අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලීටර්: ………………………………………………...........

ඉන්ධන ලීටර් පෙට්‍රල්/ඩීසල් ................. ක් ලබාදෙන්න.

නම : .......................................................

තනතුර : ...................................................

අත්සන : ...................................................

දිනය : ......................................................

---

### කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අංක .................................... දරණ වාහනයට ඉන්ධන පෙට්‍රල් /ඩීසල් ලීටර් ................. ක් නිකුත් කිරීම අනුමත කරමි / ඉන්ධන ඉල්ලීම අනුමත නොකරමි .

………………………………………

**සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)**

**ඉන්ධන ඇණවුම් අනුමත කිරීමට බලයලත් නිලධාරියා**

ඉහත වාහනයට ඉන්ධන ලීටර් ……………….. ක් ලබා ගැනීමට අංක .............................. ඇණවුම් නිකුත් කරන ලදී.

…..............…………………

දිනය : …………...........

**ප්‍රවාහන අංශයේ කාර්ය මණ්ඩල නිලධාරී**

# <u>සංචිත වාහන ඡන්ද විමසීම් රාජකාරී සඳහා යෙදවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව.</u>

"අ" කොටස

වාහනය අයත් ආයතනයේ ප්‍රවාහන නිලධාරී විසින් පිටපත් 03 කින් සම්පූර්ණ කර පිටපත් දෙකක් අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදීමට රියදුරුට භාරදෙන්න. තුන්වන පිටපත වාහනය අයත් ආයතනයේ කාර්යාල පිටපත වශයෙන් තබාගන්න.

| | | |
|---|---|---|
| 1. වාහනය අයත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සංස්ථාව | | 2. වාහන අංකය |
| 3. රියදුරුගේ නම | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. වාහනයේ වර්ගය (අදාල කොටුවල X ලකුණ යොදන්න) | | | | | | | | 5. ඉන්ධන වර්ගය (අදාල කොටුවල X ලකුණ යොදන්න) | | | | 6. ඉන්ධන ටැංකියේ ධාරිතාව | 7. ඉන්ධන ලීටර් 1 ට ධාවනය වන කි.මී. ගණන |
| ජීප් | | කැබ් | | වෑන් | | කාර් | | පෙට්‍රල් | | ඩීසල් | | ලීටර් | කි.මී. |

| | | |
|---|---|---|
| 8. ඡන්ද විමසීම් සඳහා අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කය | 10. ආයතනය ලබා දුන් ඉන්ධන ප්‍රමාණය ලීටර් : | 11. වාහනය පිටත් වන අවස්ථාවේ මයිලෝ මීටරයේ කියවීම : |
| 9. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාහනය නිදහස් කළ දිනය හා වේලාව | 12. සහතික කරන නිලධාරියාගේ අත්සන හා මුද්‍රාව | |

| | | | | |
|---|---|---|---|---|
| 2010 | | | පෙ.ව | ප.ව |

"ආ" කොටස

අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කයේ ප්‍රයෝජනය සඳහා

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. ඉහත වාහනය වාර්ථා කළ දිනය හා වේලාව | 2010 | | | පෙ.ව | ප.ව |
| 2. වාහනය දිස්ත්‍රික්කයට වාර්තා කළ අවස්ථාවේ මයිලෝ මීටරයේ කියවීම | | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3. ඡන්ද විමසීම් සඳහා වාහනය යෙද වු රාජකාරිය (අදාල කොටුවල X ලකුණ යොදන්න) | 4. දිස්ත්‍රික්කය තුල ධාවනයට ලබා දුන් ඉන්ධන ප්‍රමාණය ලීටර් | | 5. දිස්ත්‍රික්කය තුල ධාවනය කර ඇති කි.මී. ප්‍රමාණය | |
| | 6.ආපසු කාර්යාලයට යාමට ලබාදුන් ඉන්ධන ප්‍රමාණය ලීටර් | | 7.ආපසු කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය දළ වශයෙන් කි.මී. | |
| | 8. ලබා දුන් මුළු ඉන්ධන ප්‍රමාණය ලීටර් | | | |
| ඡන්ද පොළ කාර්ය මංඩලය ප්‍රවාහනය | | | | |
| කලාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන් ප්‍රවාහනය | | | | |
| වෙනත් | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. වාහනය දිස්ත්‍රික්කයෙන් නිදහස් කළ දිනය හා වේලාව | 2010 | | | පෙ.ව | ප.ව |
| 7. වාහනය නිදහස් කරන අවස්ථාවේ මයිලෝ මීටරයේ කියවීම | | | | | |

දිනය : සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන).

***<u>සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන)</u>*** -: ඡන්ද විමසීම් රාජකාරී අවසානයේ **මුල් පිටපතේ "ආ" කොටස සම්පූර්ණ කර ආපසු රැගෙන යාම සඳහා රියදුරුට භාර දෙන්න.** රියදුරු මහතාගේ ගමන් වියදම් අයදුම්පත සමග මුල් පිටපත අමුණා ඉදිරිපත් කළ යුතු අතර එහි ජායා පිටපතක් ඉන්ධන ප්‍රතිපූරණය කිරීමේ ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය.